# උතුරු පළාත් සභාව - පූර්ව මැතිවරණ සමීක්ෂණය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ ඒකකය වන සෝෂල් ඉන්ඩිකේටර් ආයතනය (SI) විසින් උතුරු පළාත් සභාව මැතිවරණයට පෙර ආසන්න කාලයේදී එනම් 2013 අගෝස්තු මාසේදී මත විමසුමක් පවත්වනු ලැබිණි. 2013 සැප්තැම්බර් 21 වන දා උතුරු පළාත සඳහා වන පළාත් මැතිවරණයන් පවත්වනු ලබන්නේ වසර 25කට පසු පළමු වරටය. මැතිවරණය දෙපාර්තමේන්තුවට අනුව, පුද්ගලයන් 7,14,488 දෙනෙකු ඡන්දය පාවිච්චි කිරීම සඳහා ලියාපදිංචි වී ඇත.




*Photograph by Vikalpa*

## ප්‍රධාන සමීක්ෂණ ප්‍රතිඵලයන්

මෙම සමීක්ෂණය මැතිවරණ ප්‍රතිඵල පිළිබඳව අනාවැකි කීම අරමුණු කරගත්තක් නොවීය. සැබවින්ම මෙහි අරමුණ වූයේ එළඹෙන මැතිවරණය පිළිබඳව ජනතාවගේ මතයන්, ප්‍රජාවට වැදගත් වන කරුණු හා යුද්ධය අවසානවූ කාලයේ සිට ඔවුන් අත්විඳි වෙනස්කම් පිළිබඳව ජනතාවගේ මතයන් පිළිබඳව වන තක්සේරුවක් ලබා ගැනීමයි.

රැකියා අවස්ථාවන්, අධ්‍යාපන පහසුකම් හී වැඩිදියුණුව, නිවාස, මාර්ග සහ ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කිරීම යනාදිය ජනතාවට හා ඔවුන්ගේ ප්‍රජාවන්ට වඩාත්ම වැදගත් වන කරුණු බව පෙනී යයි. පසුගිය වසර හතර සම්බන්ධයෙන් ප්‍රතිචාරකයන්ගේ බහුතරය (63.7%) විශ්වාස කරන්නේ උතුරු පළාතේ සංවර්ධන කටයුතු තරමක් වැඩිදියුණු ඇති වී ඇති බවයි. ඔවුන්ගෙන් (26.1%) ක් සංවර්ධන කටයුතු බෙහෙවින් වැඩි දියුණු වී ඇති බව කියා සිටිති. පුද්ගලික ආරක්ෂාව සම්බන්ධයෙන් 41.3% ක් කියා සිටින්නේ පසුගිය වසර හතරක කාලය තුළ තත්ත්වය තරමක් දුරට වැඩි දියුණු වී ඇති බවය. වෙනසක් සිදුවී නොමැති බව කියා සිටින්නේ 21.6% කි. තමන්ගේ ජීවනෝපායයන් සම්බන්ධයෙන් යම් තරමක වැඩි දියුණු වීමක් සිදුවී ඇති බව 40% ක් පමණම විශ්වාස කරන අතර 33.9% ක ගේ විශ්වාසය වී ඇත්තේ එහි වෙනසක් සිදුවී නොමැති බවයි.

තමන්ගේ ඡන්දය ලබා දීමට කැමැති අපේක්ෂකයන් තෝරා ගැනීමේදී ප්‍රතිචාරකයන් හට වඩාත්ම වැදගත් වූ සාධකය වී ඇත්තේ අපේක්ෂකයන් ප්‍රජා සේවයේ සහ ග්‍රාම සංවර්ධනයේ නියැලී සිටින අය වීමයි. ඊට සමීප දෙවන ස්ථානයක් අත්කර ගන්නේ යහපත් ප්‍රතිපත්ති ඇති, අවංක, සුදුසු අපේක්ෂකයන්ය. ප්‍රතිචාරකයන් බොහෝමයක්ම එළඹෙන මැතිවරණය පිළිබඳව සුභවාදී වන බව පෙනී යන අතර ඔවුන්ගෙන් 34.2% ක් උතුරු පළාත් සභා මැතිවරණයන් නිදහස් හා සාධාරණ වනු ඇති බව විශ්වාස කරති. 24% ක් කියා සිටින්නේ මැතිවරණ ඇතැම් විට නිදහස් හා සාධාරණ වනු ඇති බවයි. ප්‍රතිචාරකයන් 34% ක ගේ පමණ විශ්වාසය වී ඇත්තේ ද්‍රවිඩ ජාතික සන්ධානය (TNA) විසින් මැතිවරණය ජයගනු ඇති බව වන අතර 21.7% ක් එක්සත් ජනතා නිදහස් සංධානය (UPFA) ජයගනු ඇතැයි විශ්වාස කරති.

මැතිවරණ කාලයේ හැරුණු විට, සාමාන්‍යයෙන් දේශපාලනය පිළිබඳව ඔබට ඇත්තේ කෙතරම් උනන්දුවක්ද?




ප්‍රදේශයේ ජනයාට/ප්‍රජාවට වැදගත්කම කාරණා 3 -

1. රැකියා අවස්ථා
2. අධ්‍යාපනය වැඩි දියුණු කිරීම
3. නිවාස

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමේ අරමුණ වූයේ,

පාර්ලිමේන්තුවට එරෙහිව ජනාධිපතිවරයාගේ බලය වැඩි කිරීමට – **9.7%**

පළාත්වල බලය වැඩි කිරීමට – **24.1%**

සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීමට – **2.6%**

මෙරට බලය මධ්‍යගත කිරීම වැඩි කිරීමට – **3.9%**

නොදනී – **38.1%**

පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරයි - **26.1%**

ප්‍රතිචාරකයන්ගෙන් 88.8**%** ක් රජයේ සංවර්ධන වැඩසටහන වන ''උතුරු වසන්තය'' පිළිබඳව දැනුවත්ව සිටිති. එම වැඩසටහනෙන් ඔවුන් හට යහපතක් සිදුවී ඇත් දැයි ඇසූ විට 54.2**%** ක් කියා සිටියේ එසේ නොමැති වන බවයි. 11.6**%** ක් තමන් හට මහා මාර්ග ලැබී ඇති බව කියා සිටි අතර 9.8**%** ක් විදුලි බලය ලැබී ඇති බව කියා සිටියහ.

2009 දී ''උතුරු වසන්තය'' වැඩසටහන දියත් කරනු ලැබුයේ ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍රයන් තුනක් වෙත අවධානය යොමු කරමිනි. එනම් ආරක්ෂාව, නැවත පදිංචි කිරීම් හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම යන ක්ෂේත්‍රයන් ය. එය අවධීන් තුනකින් යුතුව කෙටි කාලීන හා දීර්ඝ කාලීන වශයෙන් වූ දින 180ක සැලස්මක් ලෙස ඇරඹිනි.

පසුගිය වසර දෙක ගත් කල, නැගෙනහිර පලාත තුල පහත සඳහන් තත්වයන් කොතරම් දුරට වෙනස් වී ඇත්දැයි යන්න දක්වන්න.



උතුරු පළාත් මැතිවරණයෙ කුමන පක්ෂය ජයග්‍රහනය කරයි ඔබ විශ්වාස කරන්නේද?




උතුරු පළාත් මැතිවරණය සාධාරණ හා නිදහස් මැතිවරණයක් විය යැයි ඔබ විශ්වාස කරන්නේද?




අපේක්ෂයන් තේරීමේදී ඔබ සලකන ලද වඩාත්ම වැදගත් කාරණය කුමක්ද?

ප්‍රජා සේවයේ සහ ග්‍රාම සංවර්ධනයේ නියැලී සිටින අය – **26.4%**
යහපත් ප්‍රතිපත්ති ඇති, අවංක, සුදුසු අපේක්ෂකයන් – **26.1%**

## ක්‍රමවේදය

මෙම සමීක්ෂණය උතුරු පළාතේ ලියාපදිංචි ඡන්ද දායකයන් 617 දෙනෙකු අතර පැවැත්වූවක් විය.

ප්‍රතිචාරකයන්ගෙන් 54.5% ක් පිරිමින් වූ අතර 45.5% ක් කාන්තාවන් විය. උතුරු පළාතේ දිස්ත්‍රික්ක 5 (යාපනය, මුලතිව්, කිලිනොච්චි, වවුනියා සහ මන්නාරම) තුළ සාම්පලය පැතිර වුණේ 2010 උතුරු පළාතේ ජන සංගනනය මත පදනම් වූ ජනගහන සමානුපාතික සාම්පල් කරණය (Population proportionate sampling) උපයෝග කොට ගනිමිනි. ජනවාර්ගික අනුපාතයන් පැහැදිලි කරනු ලැබිණි. සාම්පලය දිස්ත්‍රික් හරහා ස්ථරකරණය (Stratification) කරනු ලැබූ අතර දිස්ත්‍රික්කයක් තුළ මැතිවරණ කොට්ටාශයන් අහුඹු ලෙස තෝරා ගනු ලැබිණි. තෝරාගත් එක් එක් මැතිවරණ කොට්ඨාශයන් තුළින් ප්‍රතිචාරකයන් 60 දෙනෙකු බැගින් තෝරා ගනු ලැබූ අතර එහිදී එම ප්‍රදේශවල වත්මන් තත්ත්වය නිසා ස්නෝබෝල් ක්‍රමවේදය (Snowball method) භාවිත කරනු ලැබිණි. කෙසේ වුවද මැතිවරණ කොට්ඨාශයන් තෝරාගැනීම දක්වා අහුඹු සාම්පල්කරණ ශිල්පීය ක්‍රම (Random Sampling techniques) යොදාගනු ලැබිණි. ක්ෂේත්‍ර පර්යේක්ෂකයන් 11 දෙනෙකු විසින් 2013 අගෝස්තු 5 - 15 දක්වා ක්ෂේත්‍ර වැඩකටයුතු සිදුකරනු ලැබිණි.

**SOCIAL INDICATOR**
105, Fifth Lane, Colombo 3, Sri Lanka | Tel: 0094 112370472/6 | Fax: 0094 112370476
info@cpasocialindicator.org | http://www.cpalanka.org/survey-research/